37085

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

## 10 - ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - I

නම/විභාග අංකය :- ............................................................ කාලය: පැය 01යි.

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 40

(01) ත්‍රි ලක්ෂණය නම්
(1) ශීල, සමාධි, ප්‍රඥා (2) දාන, ශීල, භාවනා (3) අනිත්‍ය, දුක්ඛ, අනාත්ම (4) රාග, ද්වේෂ, මෝහ

(02) ආර්ය අෂ්ටාංගික මාර්ගයේ "සම්මා ආජීව" අයත් වන්නේ,
(1) සීලයට ය. (2) සමාධියට ය. (3) ප්‍රඥාවට ය. (4) කර්මයට ය.

(03) පස්වග මහණුන්ට රහත්වීම සඳහා දේශනා කරන ලද සූත්‍ර දේශනාව වනුයේ,
(1) කාලාම සූත්‍ර දේශනාවට ය. (2) අම්බට්ඨ සූත්‍ර දේශනාවට ය.
(3) දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවට ය. (4) අනත්ත ලක්ඛණ සූත්‍ර දේශනාවට ය.

(04) "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" චේතයිත්වා කම්මං කරෝති, කායේන වාචාය මනසා" මෙම පාඨය ඇතුළත් වන්නේ,
(1) නිබ්බේදක සූත්‍රය (2) අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍ර දේශනාව
(3) අනන්තලක්ඛණ සූත්‍ර දේශනාවට ය. (4) චූල්ලහත්ථි පදෝපම සූත්‍ර දේශනාව

(05) බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව වන්නේ,
(1) ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාව ය. (2) අරියවංශ සූත්‍ර දේශනාව ය.
(3) නිබ්බේදික සූත්‍ර දේශනාව ය. (4) වේළුද්වාර සූත්‍ර දේශනාව ය.

(06) විපාක දෙන ආකාරය අනුව කර්මය කොටස් හතරකට බෙදා දක්වා ඇත. ඒවා මෙසේ සඳහන් කළ හැකි ය.
(1) දිට්ඨ ධම්ම වේදනීය, උපපජ්ජ වේදනීය, අපරාපරිය වේදනීය, අහෝසි කම්ම
(2) ගරුක කර්ම, ආසන්න කර්ම, ආචිණ්ණ කර්ම, කටත්තා කර්ම
(3) ජනක කර්ම, උපස්ථම්භක කර්ම, උපපීඩක කර්ම, උපඝාතක කර්ම
(4) ගරුක කර්ම, ජනක කර්ම, උප්පජ්ජවේදනීය කර්ම, අහෝසි කර්ම

(07) බිම්බිසාර රජතුමා විසින් බුදුරජාණන් වහන්සේට පූජා කරන ලද ආරාමය,
(1) ජේතවනාරාමය (2) වේළුවනාරාමය (3) පූර්වාරාමය (4) නිග්‍රෝධාරාමය

(08) කිසියම් පුද්ගලයෙකු හෝ පිරිසක් වෙනුවෙන් බුදුරජාණන් වහන්සේ විශේෂයෙන් ම දහම් දේශනා කිරීමට වැඩවීම මෙලෙස හඳුන්වනු ලැබේ.
(1) අතුරිත චාරිකා (2) සෘද්ධියෙන් ගමන් කිරීම (3) සක්මන් චාරිකා (4) තුරිත චාරිකා

(09) "බමුණ ඔබගේ නිවසට පැමිණෙන ආගන්තුකයන් සඳහා පිළිවෙළ කරන ලද සංග්‍රහයන් ඔවුන් නොපිළිගන්නේ නම් එය ඔබටම වන්නාක් මෙන් ඔබගේ සංග්‍රහය නොපිළිගන්නා බැවින් එය නැවතත් ඔබටම වේ." මෙසේ බුදුරජාණන් වහන්සේ දේශනා කළ ලද්දේ කා හට ද?
(1) චංකී බමුණාට ය. (2) අක්කෝස භාරද්වාජ බමුණාට ය.
(3) ද්‍රෝණ බමුණාට ය. (4) සේල බමුණාට ය.

(10) විවිධ ආගමික විශ්වාස රාශියකින් යුතු සමාජයක් බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවක පිරිස සමග අනුගමනය කළේ,

(1) ගැටුම්වලින් තොර සාමකාමී සහජීවන ප්‍රතිපත්තියකි.

(2) වාද කර තම අරමුණ ජයගන්නා ප්‍රතිපත්තියකි.

(3) ඉවසීමෙන් තොරව කටයුතු කිරීමේ ප්‍රතිපත්තියකි.

(4) අවස්ථාවට අනුව කටයුතු කිරීමේ ප්‍රතිපත්තියකි.

(11) බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පසුව සති හතක් විමුක්ති සුවයෙන් යුතුව ගත කළ සේක. ඒ අනුව දෙවන සතිය වැඩ සිටියේ,

(1) අනිමිස ලෝචන පූජාව. (2) රුවන් සක්මන. (3) අජපාල නුගරුකමුල (4) මුචලින්ද නාගදරණය

(12) "බ්‍රාහ්මණය නිල්, රතු හෝ සුදු පියුමක් දියෙහි ඉපිද, දියෙහි වැඩී, දියෙන් උඩට පැමිණ, දිය හා අසම්බන්ධවපවතින්නාක් මෙන්, මම ද ලොවෙහි ඉපිද, ලොවෙහි වැඩී ලොව හා අසම්බන්ධව ලොව ඉක්මවා සිටිමි..." මෙසේ බුදුන් වහන්සේ දේශනා කළේ,

(1) ද්‍රෝණ බමුණාට ය. (2) උපාලි ගෘහපතියාට ය. (3) අස්සලායන බමුණාට ය. (4) වංකී බමුණාට ය.

(13) නිර්වාණ ගාමී පුද්ගලයා විසින් ගමන් කළ යුතු ආර්ය අෂ්ඨාංගික මාර්ගය කොටස් තුනකට බෙදා දක්වා ඇත. ඒ කොටස් නම්

(1) පාරමී, උපපාරමී, පරමත්ථ පාරමී (2) බුදු, පසේ බුදු, මහරහත්

(3) දාන, ශීල, භාවනා (4) සීල, සමාධි, පඤ්ඤා

(14) ඉන්ද්‍රිය සංවරය ලෙසට හඳුන්වනු ලබන්නේ,

(1) කය, වචන, සංවරයයි

(2) හිඳීම, සිටීම, ඇවිදීම ආදී ක්‍රියා සිහිකල්පනාවෙන් කිරීමය

(3) ඇස, කන, නාසය, දිව යන ඉන්ද්‍රිය සංවර කරගැනීම ය.

(4) ලද දෙයින් සතුටු වීම ය.

(15) බුදු දහම තුළ "ශ්‍රාවක සංඝ" යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

(1) සිව්පසයෙන් පුද කිරීම සුදුසු උතුමන්වීම ය.

(2) සෝවාන්, සකෘදාගාමී, අර්හත් සතර මග හා සතරඵල ලබාගත් උතුමන්වීමය.

(3) භාවනානුයෝගීව කටයුතු කරන උතුමන් වීම ය.

(4) නිවැරදි ලෙස විනය කරුණු අනුගමනය

(16) බුදුරදුන් හමුවීමට දුරසිට පැමිණි පුක්කුසාතිට බුදුරදුන් හමු වූ ස්ථානය වන්නේ,

(1) ජේතවනාරාමයේ දී (2) පූර්වාරාමයේ දී (3) කුඹල්හලක දී (4) රජගහනුවරදී

(17) බුදුරජාණන් වහන්සේගේ දින චර්යාවෙන් ගත හැකි ආදර්ශය වන්නේ,

(1) දවසේ වැඩිම කාලය විවේකීව ගත කළ යුතු බව

(2) කාලසටහනකට අනුව කටයුතු කරමින් කාලයේ උපරිම ප්‍රයෝජන ගත යුතු බව

(3) සෞන්දර්යය විඳගැනීම සඳහා දවසේ කොටසක් වෙන් කළ යුතු බව

(4) යහළු මිත්‍රයන් සමග දවසේ වැඩි කාලයක් ගත කළ යුතු බව

(18) "මාගේ මේ ව්‍යායාමය රජ සැප ලබාගැනීම පිණිස නොව බුදු සසුනේ චිර පැවැත්ම ආරක්ෂා කිරීමට ය." මෙසේ ප්‍රකාශ කළේ,

(1) පරාක්‍රමබාහු රජතුමා ය. (2) ධාතුසේන රජතුමා ය. (3) සද්ධාතිස්ස රජතුමා ය. (4) දුටුගැමුණු රජතුමා ය.

(19) යහපත් ක්‍රියා සටහන් කිරීම සඳහා දුටුගැමුණු රජතුමා විසින් සටහන් තබන ලද පුස්තකය හඳුන්වන නම

(1) දින චර්යා පුස්තකය නමින් ය. (2) පිරිත්පොත නමින් ය.

(3) පින්පොත නමින් ය. (4) සාධුචර්යා පුස්තකය නමින් ය.

(20) කරණීය මෙත්ත සූත්‍රයේ සඳහන්වන "සුවචෝ" යන වචනයේ අදහස වන්නේ,

(1) අවංක වීමය. (2) පහසුවෙන් පෝෂණය කළ හැකි වීමය.

(3) තැනට සුදුසු නුවණ තිබීම. (4) පහසුවෙන් යමක් කියා ඒත්තු ගැන්විය හැකිවීම.

(21) ලෝකපාලන ධර්ම ලෙසද දේවධර්ම ලෙස ද හඳුන්වනු ලබන්නේ,
(1) සමාධිය හා ප්‍රඥාවයි. (2) සීල හා සමාධියයි
(3) පව්කිරීමට ඇති බිය හා ලැජ්ජාවයි (4) තණ්හාව හා ආශාවයි.

(22) සිඟාලෝවාද සූත්‍රයේ ස්වාමියා විසින් බටහිර දිශාව වන භාර්යාවට සැලකිය යුතු ආකාර පහක් දක්වා ඇත. එයට අයත් නොවන වරණය වන්නේ,
(1) ගරු සැලකිලි දැක්වීම. (2) වගකීම් පැවරීම.
(3) අවමන් නොකිරීම. (4) කටයුතු මනා ලෙස සංවිධානය කිරීම

(23) දෙව්යකු යක්ෂණියක සමග ජීවත් වනවාය යන අදහස් ඇත්තේ,
(1) දේවෝ දේවියා සද්ධිං සංවසති (2) ජවෝ ජවාය සද්ධිං සංවසති
(3) ජවෝ දේවියා සද්ධිං සංවසති (4) දේවෝ ජවාය සද්ධිං සංවසති

(24) පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට බලපාන ලද ආසන්නතම හේතුව වූයේ,
(1) වජ්ජි පුත්‍රක භික්ෂූන් දස අකැප වස්තුව ඉදිරිපත් කිරීම.
(2) ලාභ සත්කාර අපේක්ෂාවෙන් තීර්ථකයන් පැවිදිවීම.
(3) සුභද්‍ර භික්ෂුවගේ අභද්‍ර වචනයයි.
(4) භික්ෂූන් වහන්සේලා අතර ගැටළු මතුවීම.

(25) ඍජුබව - මෘදු බව - පරිත්‍යාගය - තපස යන කරුණු ඇතුළත් වන්නේ කුමන රාජ්‍ය පාලන මූලධර්මවලට ද?
(1) සතර අගතිය (2) සතර සංග්‍රහ වස්තුව (3) සප්ත අපරිහානීය ධර්ම (4) දසරාජ ධර්ම

(26) භික්ෂුවකගේ සිවුර සකස් විය යුතු අන්දම බුදුරජාණන් වහන්සේ විසින් ආනන්ද හිමියන්ට දේශනා කර ඇත. එය සකස් වූයේ,
(1) භික්ෂුවට පරිහරණය කිරීම පහසු වන ලෙසට ය. (2) ගෙවත්තක් සකස්විය යුතු ආකාරය අනුව ය.
(3) මගධ දේශයේ කෙත්යායක ආකෘතිය අනුවය. (4) කිඹුල්වත්පුර නගරයේ සැලැස්ම අනුවය.

(27) බෞද්ධ ප්‍රතිපදාවේ ගමන් කරන පුද්ගලයෙකු ක්‍රියා කළ ආකාරය ලෙසට පෙන්වා දී ඇත්තේ,
(1) තමා ගැන පමණක් කල්පනාකර කටයුතු කිරීම ය. (2) අනුන් ගැන පමණක් කල්පනාකර කටයුතු කිරීම ය.
(3) තමා උපමාකොට සිතා කටයුතු කිරීම ය. (4) අනුන් උපමා කොට සිතා කටයුතු කිරීම ය.

(28) වළගම්බා රාජ්‍ය සමයේ ලංකාවේ දකුණු ප්‍රදේශයේ බමුණෙකු විසින් රජුට විරුද්ධව කැරැල්ලක් ඇති කළේ ය. එම කැරැල්ල සඳහා නායකත්වය දෙන ලද පුද්ගලයා ලෙසට ඉතිහාසයෙහි සඳහන් වන්නේ.
(1) අසේලක නම් බමුණා ය. (2) සේනක නම් බමුණා ය. (3) සොත්ථිය නම් බමුණා ය. (4) තිස්ස නම් බමුණා ය.

(29) විහාරස්ථානයකට ගොස් වන්දනා කිරීමේ දී වැඳිය යුතු පිළිවෙළ ලෙස සඳහන් වන්නේ,
(1) ස්තූපය, බෝධිය, විහාර මන්දිරය. (2) බෝධිය, ස්තූපය, විහාර මන්දිරය
(3) ස්තූපය, විහාර මන්දිරය, බෝධිය (4) බෝධිය, විහාර මන්දිරය, ස්තූපය

(30) බෞද්ධ ස්තූප ආකෘති වර්ග කිහිපයක් ඇත. ස්තූපය නිර්මාණ කර ඇති සැලැස්ම දෙස බලනවිට එහි මුලින්ම ඇත්තේ,
(1) ගර්භය වන්නේ ය. (2) පේසා වළලු තුන වන්නේ ය.
(3) හතරැස් කොටුව වන්නේ ය. (4) දේවතා කොටුව වන්නේ ය.

(31) බුදුරජාණන් වහන්සේගේ අතීත භවයන් හි සිදුවීම් ඇතුළත් වන ග්‍රන්ථය ලෙස ද, බෞද්ධයන්ගේ පූජනීය කෘතිය ලෙස ද සැලකෙන පන්සිය පනස් ජාතක පොත් වහන්සේ අයත් වන්නේ,
(1) කුරුණෑගල යුගයටයි. (2) අනුරාධපුර යුගයටයි. (3) ගම්පොළ යුගයටයි. (4) දඹදෙණිය යුගයටයි.

(32) කලා ශිල්පීන් විසින් බුදු පිළිම නිර්මාණය කිරීමේ දී විවිධ වූ මුද්‍රාවන් අනුගමනය කර ඇත. ඒ අතර ඇති අභය මුද්‍රාව මගින් සංකේතවත් වන්නේ,
(1) බියවීමට හේතුවක් නැති බව සංකේතවත් කිරීම. (2) ධර්මයෙහි බලය සංකේතවත් කිරීම
(3) තම බුද්ධත්වයට මහපොළොව සාක්ෂි දරණ බව පෙන්වාදීම (4) භාවනානුයෝගී බව පෙන්වීම.

(33) ශ්‍රේෂ්ඨ කලා නිර්මාණයක් වන සඳකඩ පහණ අයත් වන්නේ,

(1) ඉන්දීය කලා නිර්මාණවලට ය. (2) බුරුම රටේ කලා නිර්මාණවලට ය.
(3) මගධ දේශයේ කලා නිර්මාණවලට ය. (4) ශ්‍රී ලාංකික කලා නිර්මාණවලට ය.

(34) පැරණි සිංහල සාහිත්‍ය හැදෑරීමේ දී රටෙහි රාජ්‍ය පාලන යුග අනුව සාහිත්‍ය යුග බෙදා දක්වා ඇත. එම යුග කීයක් වන්නේ ද?

(1) අටක් වන්නේ ය. (2) පහක් වන්නේ ය. (3) නවයක් වන්නේ ය. (4) දහයක් වන්නේ ය.

(35) "දරුවා, මෙම චක්‍රවර්ති රාජ්‍යය ඔබට පිය උරුමයක් ලෙසට ලබන්නේ නොවේ. ඔබ ඒ සඳහා හිසි පිළිවෙත් පුරා සුදුස්සෙකු විය යුතු ය." මෙම අදහස මගින් පෙනී යන්නේ,

(1) රාජ්‍යය පිය උරුමයෙන් ලැබෙන බවය. (2) රාජ්‍යය සටන් කර ගත යුතු දෙයක් ලෙස ය.
(3) පාලකයා රාජ්‍ය පාලනය සඳහා සුදුසු විය යුතු බවය. (4) රාජ්‍ය පාලනය පොදු ජනතාවගෙන් ලබා ගතයුතු බවය.

(36) කාලාම සූත්‍ර දේශනාව මගින් බුදුරජාණන් වහන්සේ කාලාම වරුනට පෙන්වා දෙන්නේ

(1) ත්‍රිලක්ෂණය පිළිබඳව වන දේශනාවකි. (2) චතුරාර්ය සත්‍යය පිළිබඳ දේශනාවකි.
(3) හේතුඵල වාදය පිළිබඳ දේශනාවකි. (4) සිතීමේ හා විමසීමේ නිදහස පිළිබඳ දේශනාවකි.

(37) දසසක්විතිවත් ඇතුළත් වන සූත්‍ර දේශනාව ලෙසට සඳහන් වන්නේ,

(1) කාලාම සූත්‍ර දේශනාවය (2) චක්කවත්ති සීහනාද සූත්‍ර දේශනාව
(3) කරණීය මෙත්ත සූත්‍ර දේශනාව (4) සිඟාලෝවාද සූත්‍ර දේශනාව

(38) ධර්මසේන හිමියන් රචනා කරන ලද සිංහල ගද්‍ය සාහිත්‍යයේ සම්භාවනීය ගෞරවයට ලක් වූ කෘතිය වන්නේ,

(1) බුත්සරණ ය. (2) ධර්ම ප්‍රදීපිකාව ය.
(3) සද්ධර්මාලංකාර ය. (4) සද්ධර්මරත්නාවලිය.

(39) බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීමට අනුව පුද්ගලයා උසස් පහත් බවට පත්වන්නේ,

(1) තමා උපන් ජාතියට අනුව ය. (2) තමා උපන් කුලයට අනුව ය.
(3) තමා කරන නිර්මාණවලට අනුව ය. (4) තමා කරන ක්‍රියාවලට අනුව ය.

(40) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ,

(1) පළමු සංගායනාවේ දී ය. (2) දෙවන සංගායනාවේ දී ය.
(3) සිව්වන සංගායනාවේ දී ය. (4) හයවන සංගායනාවේ දී ය.